00023

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - **2019/2020**

**EPC1335/ESC1135 - නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සහ හසුරු කුසලතා සංවර්ධනය**

කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - 2023.06.17 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

පළමු වන කොටසේ **සියළුම** ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද **(03)** පිළිතුරු සපයන්න.

## <u>පළමු වන කොටස</u>

01. හසුරු කුසලතා සංවර්ධන අවධි පහ සඳහන් කරන්න.

02. පෙර පාසල් ළමුන්ගේ හසුරු කුසලතා සංවර්ධනයේ අරමුණු තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න.

03. පෙරපාසල් ළමුන්ගේ සියුම් චාලක කුසලතා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් පහක් **(05)** දක්වන්න.

04. පෙරපාසල් ළමුන්ගේ දළ චාලක කුසලතා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් පහක් **(05)** දක්වන්න.

05. පෙරපාසල් පන්තිකාමරය තුළ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ හැකි ස්වභාවික ද්‍රව්‍ය පහක් **(05)** ලැයිස්තු ගත කරන්න.

06. ළමා නාට්‍ය සඳහා 'වෙස් මුහුණු' භාවිත කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පෙරපාසල් ගුරුවරියක ලෙස ක්‍රියාකාරකම් සඳහා කතාන්දර තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ගුරුවරියක ලෙස චිත්‍ර හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල පෙරපාසල් ළමුන් නිරත කරවීමේ දී පෙළඹවීමට ගත හැකි උපාය මාර්ග තුනක් **(03)** සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) පෙරපාසල් ළමුන් සඳහා නැටුම් සංගීත සහ නාට්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී ගුරුවරයෙකු විසින් සැලකිය යුතු කරුණු **පහක් (05)** උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "පෙරපාසල් ළමුන්ගේ හිතකර සමාජ චර්යා දියුණු කිරීමට කතාන්දර සහ නාට්‍ය ඉතා වැදගත් වේ. "

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර සුදුසු උදාහරණ සහිතව සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

10. (i) පෙරපාසල තුළ සංගීත ක්‍රියාකාරකම් සඳහා භාවිත කළ හැකි උපකාරණ **පහක් (05)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 10)

(ii) ගුරුවරයෙකු ලෙස පෙරපාසල් ළමුන් සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) ළමා චිත්‍ර සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිත කළහැකි ඉවත ලන ද්‍රව්‍ය **පහක් (05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) ළමා චිත්‍ර සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා ස්වභාවික සහ ඉවතලන ද්‍රව්‍ය භාවිතයේ වැදගත්කම විශ්ලේෂණය කර ඉහත ඔබ සඳහන් කල ඉවතලන ද්‍රව්‍ය පහ **(05)** භාවිත කිරීමට බලාපොරොත්තු වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 15)

12. (i) පූර්ව මනෝ රටා අවධියේ ළමුන්ගේ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ළමුන්ගේ නිර්මාණශීලීත්ව සංවර්ධනයට දෙමාපියන්ට කෙසේ උදව් විය හැකිදැයි ආකාර **පහකින් (05)** විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) "සුළඟ" "අහස" "සරුංගලය" යන තේමාවලින් එකකට අදාළව කතාන්දරයක් කෙටියෙන් ලියන්න. (ලකුණු 10)

(ii) මෙම කතාන්දරය තුළින් ඔබ ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු හතරක් **(04)** දක්වන්න. (ලකුණු 02)

(iii) ඔබ විසින් ඉහත සඳහන් කළ කතාන්දරයට අදාළ අරමුණු ළඟාකර ගන්නා ආකාරය පියවර සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.